සුවෙන් පෙරට

e ඉගෙනුම් පියස

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය



| වාරය - | දෙවන වාරය | |
|---|---|---|
| ශ්‍රේණිය :10 | විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය | පාඩම : 9 වන පාඩම<br>1. කර්තෘ කාරක වාක්‍ය සහ කර්මකාරක වාක්‍ය |

පාඩම හැඳින්වීම

උක්ත ආඛ්‍යාත පද සම්බන්ධ වන ආකාරය අනුව, වාක්‍ය කොටස් දෙකකි.

01. කර්තෘ කාරක වාක්‍ය
02. කර්ම කාරක වාක්‍ය

. එම වාක්‍ය දෙක අතර ප්‍රධාන වෙනස්කම් පහත සඳහන් පරිදි හඳුනා ගත හැකිය.

| කර්තෘ කාරක වාක්‍ය | | | කර්මකාරක වාක්‍ය | | |
|---|---|---|---|---|---|
| මිනිස්සු | දෙවියන් | පුදති. | මිනිසුන් විසින් | දෙවියෝ | පිදෙති / පුදනු ලබති. |
| ↓ | ↓ | ↓ | ↓ | ↓ | ↓ |
| කර්තෘ | කර්මය | ආඛ්‍යාතයෙන් | කර්තෘ | කර්මය | ආඛ්‍යාතයෙන් |
| උක්ත වී ඇත | අනුක්ත වී ඇත | කර්තෘ උක්ත වී ඇත. | අනුක්ත වී ඇත | උක්ත වී ඇත. | කර්මය උක්ත වී ඇත. |

- කර්තෘකාරක වාක්‍යයෙහි " පුදති " යන ආඛ්‍යාතයෙන් කර්තෘ උක්ත වී ඇත. එනිසා එය කර්තෘකාරක වාක්‍යයක් යැයි කියනු ලැබේ.

- කර්මකාරක වාක්‍යයෙහි "පිදෙති/පුදනු ලබති " යන ආඛ්‍යාතයෙන් කර්මය උක්ත වී තිබේ. ඒ නිසා එය කර්මකාරක වාක්‍යයක් ලෙස හැඳින්වේ.

ඉහත කරුණු පහත වාක්‍ය සමග සසඳා බලන්න.

| කර්තෘ කාරක වාක්‍ය | කර්ම කාරක වාක්‍ය |
|---|---|
| • මිනිස්සු සතුන් ඇති කරති | • මිනිසුන් විසින් සත්තු ඇති කෙරෙති. |
| • දෙමව්පියෝ දරුවන් සුරකිති | • දෙමව්පියන් විසින් දරුවෝ සුරැකෙති. |
| • ගොවියා ගවයන් බඳියි | • ගොවියා විසින් ගවයෝ බැඳෙති |

කර්තෘකාරක වාක්‍යයක් කර්ම කාරක බවට පත් කිරීමේදී පියවර 4 ක් යටතේ ඉදිරිපත් කළ හැකිය.

උදාහරණ : මව්පිරු දරුවන් නළවති ( කර්තෘකාරක )
මව්පරුන් විසින් දරුවෝ නැළවෙති ( කර්මකාරක )
1 2 3 4

1. උක්ත කර්තෘ අනුක්ත බවට පත්කිරීම .
2. අනුක්ත කර්තෘට පරව විසින් යන උපකාරක නිපාතය යෙදීම.
3. අනුක්ත කර්මය උක්ත කර්මය බවට පත් කිරීම
4. ආඛ්‍යාතය උක්ත කර්මයට අදාළව කර්ම කාරකයෙන් තැබීම

( මෙහිදී කාල භේදය වචන භේදය සලකා ලද /ලබ ධාතුවෙන් තැබිය යුතුය )

- අප්‍රාණවාචී නාමපදයක් කර්මය ලෙස යෙදුණු වාක්‍ය කර්මකාරකයට නැගීමේදී පදයේ වෙනසක් සිදු නොවේ.
  උදාහරණ - මිනිස්සු ගස් වවති ➡ මිනිසුන් විසින් ගස් වැවෙයි./ වවනු ලබයි.
  ළමයි මල් කඩති ➡ ළමයින් විසින් මල් කැඩෙයි / කඩනු ලබයි.

<u>**ස්වයං ඉගෙනුම් අභ්‍යාස**</u>

ඉහත සටහන ද උපයෝගී කරගෙන පාඩම කියවා පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

01. භාෂාවේ හමුවන පද වර්ග හතරක් නම් කරන්න.

02. වාක්‍යයක් යනු කුමක්ද ?

03. උක්තාඛ්‍යාත පද සම්බන්ධය බිඳීමෙන් වන හානි දෙකක් ලියන්න

04. වාක්‍යයක දක්නට ඇති ප්‍රධාන අංක තුන නම් කරන්න

05. උක්තාඛ්‍යාත පද ගැළපීම අනුව සකස් වන වර්ග දෙක නම් කරන්න.

06. “ සාදයි “ යන ක්‍රියාව පුරුෂත්‍රයට අනුව වර්තමාන කාලයෙහි වරනැගෙන අයුරු දක්වන්න.

07. කර්තෘ කාරක වාක්‍යයක ආඛ්‍යාතය යෙදෙන්නේ කුමකට අනුව ද ?

08. කර්තෘ කාරක වාක්‍යයක කර්මය කෙසේ පවතීද ?

09. කර්ම කාරක වාක්‍යයක කර්තෘගේ ලක්ෂණ දෙකක් දක්වන්න.

10. කර්ම කාරක වාක්‍යයක කර්මය කෙසේ පවතී ද ?

11. කර්ම කාරක වාක්‍යයේ ආඛ්‍යාතය තබන්නේ කෙසේ ද ?

12. කර්මකාරක වාක්‍යයක ලක්ෂණ තුනක් නම් කරන්න.

13. කර්මකාරක ස්වරූපයෙන් ලිවිය නොහැකි වාක්‍ය කුමක්ද ?